# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2264/14 – 2022 ජනවාරි 26 වැනි බදාදා – 2022.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝගොඩ සුළු කොට්ඨාසයේ, ජගුල්ල 77 B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැගම (අ.ග.පි. 382) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/HLE/2019/343 හා 2019.10.02 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

1. කැබලි අක්ෂර **‘A’** – ක්වින්ස්ටවුන් වත්ත (සෙරන්ඩිබ් කොටස) – **ප්‍රමාණය: හෙක්. 0.0253 ක් පමණ**

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ක්වින්ස්ටවුන් වත්ත සහ වතුපාර; නැගෙනහිරට: වතුපාර සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ක්වින්ස්ටවුන් වත්ත; දකුණට සහ බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ක්වින්ස්ටවුන් වත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,<br>
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2018/S/308.<br>
2021 දෙසැම්බර් මස 10 වැනි දින,<br>
ඉඩම් අමාත්‍යාංශය,<br>
''මිහිකත මැදුර'',<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

EOG 01 – 0258



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*